# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2107/31 - 2019 ජනවාරි මස 23 වැනි බදාදා - 2019.01.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංක : IR/21/52/2013

### කාර්මික ආරාවුල් පනත 131 වැනි අධිකාරය

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2013.12.02 දිනැති හා අංක 1839/1 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2013.11.29 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් කොළඹ 10, ආනන්ද රාජකරුණා මාවත, අංක 141 හි පිහිටි නිදහස් වෙළෙඳ කලාප සහ පොදු සේවා සේවක සංගමය හා අනෙක් පාර්ශ්වය වශයෙන් බියගම, බියගම අපනයන සැකසුම් කලාපයේ පිහිටි ඇන්සල් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2018.11.29 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 ජනවාරි මස 11 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

යොමු අංකය IR/21/52/2013

නිදහස් වෙළඳ කලාප සහ පොදු
සේවා සේවක සංගමය,

අංක 141, ආනන්ද රාජකරුණා මාවත,
කොළඹ 10

*ඉල්ලුම්කාර පාර්ශ්වය*

නඩු අංකය : ඒ/3529

සහ

ඇන්සල් ලංකා පුද්ගලික සමාගම,
බියගම අපනයන සැකසුම් කලාපය,
බියගම.

*වග උත්තරකාර පාර්ශ්වය*

ප්‍රදානය

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා ගරු අමාත්‍ය ගාමිණී ලොකුගේ මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තියෙන් එතුමන් වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, බත්තරමුල්ල, පන්නිපිටිය පාරේ නො. 77, ටී. පියසෝම වන මා 2013.11.29 වන දින පත්කොට මෙම ආරවුල මා වෙත යොමුකර ඇත.

කම්කරු අමාත්‍යතුමන්ගේ නියමය පරිදි මා වෙත යොමු කර ඇති අංක IR/21/52/2013 හා 2013.11.29 දිනැති යොමු කිරීම මගින් එම බේරුම්කරණයට අදාළ ඉහත පාර්ශ්වයන් අතර පවතින කාර්මික ආරවුලට සම්බන්ධ විභාගයක් පවත්වා ආරවුලට සම්බන්ධ 2 වන පාර්ශ්වය වන ඇන්සල් ලංකා පුද්ගලික සමාගම විසින් බේරුම්කරණයේ නම් සඳහන් පහත සඳහන් සේවකයින්ගේ සේවය අවසන් කිරීම යුක්ති සහගත ද, සාධාරණ ද යන්න නිගමනය කිරීමටත් ඔවුන්ගේ සේවය අවසන් කිරීම යුක්ති සහගත සහ සාධාරණ නොවන අයුරින් සිදු කර තිබේ නම් ඔවුන්ට කවර සහන හිමි වන්නේ ද යන කරුණ තීන්දු කිරීමේ කාර්යය මා වෙත පවරා ඇත.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

2 ආරවුලට සම්බන්ධ පහත නම් සඳහන් සේවකයින් වෙනුවෙන් ඔවුන්ගේ වෘත්තීය සමිතිය වන නිදහස් වෙළඳ කලාප සහ පොදු සේවා සේවක සංගමය පළමුවන පාර්ශ්වය නියෝජනය කළ අතර නඩු විභාගය අවසාන භාගය වන විට නීතිඥ ටී. ලීලානන්ද මහතා පළමුවන පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටින ලදී. බේරුම්කරණයට අදාළ සේවක පිරිස පහත දැක්වේ :-

01. කේ. ඒ. ඩී. අතුල කමල් කළුආරච්චි
02. එස්. කනපති
03. කේ. කේ. ඒ. ඩී. විපුල කළුආරච්චි
04. ජේ. ඒ. කමල් ජයතිස්ස
05. ඩබ්ලිව්. ජී. දසන්ත ජයලත්
06. යූ. ඒ. චන්දන රොෂාන්
07. මුදලිගේ ශාන්ත කුමාර්
08. ඒ. එල්. එම්. නෂාර්
09. ජී. ඒ. එල්. අජිත් ප්‍රියන්ත
10. ජේ. එන්. ජේ. පී. පී. කේ. ජයවික්‍රම
11. ඩී. ජේ. රෝහිත ද සිල්වා යන අය වේ.

(අ) දෙවන පාර්ශ්වය බියගම ආයෝජන ප්‍රවර්ධන කලාපය තුළ පිහිටි සේවකයින් 2000 කට වඩා වැඩියෙන් සේවය කළ ආයතනයක් වන බවත්,

(ආ) පළමුවන පාර්ශ්වයේ වෘත්තීය සමිති ශාඛාවක් දෙවන පාර්ශ්වයේ ආයතනය තුළ ක්‍රියාත්මක වූ බවත්,

(ඇ) බේරුම්කරණයට අදාළ කේ. ඩී. අතුල කමල් කලුආරච්චි යන අය දෙවන පාර්ශ්වයේ ආයතනය තුළ ක්‍රියාත්මක වූ නිදහස් වෙළඳ කලාප හා පොදු සේවක සංගමයේ ශාඛා සමිතියේ සභාපති වූ බවත්,

(ඈ) වෘත්තීය සමිතිය විසින් නිතර නිතර සේවක ප්‍රශ්න සම්බන්ධයෙන් කළමනාකාරිත්වය වෙත කරුණු ඉදිරිපත් කළ බවත්,

(ඉ) 2013.04.10 වෙනි දින දෙවන පාර්ශ්වයේ ආයතනය තුළ එහි සාමාන්‍යාධිකාරීවරයා සහ අනෙකුත් කාර්ය මණ්ඩලයේ සහභාගිත්වයෙන් රැස්වීමක් පැවැති අවස්ථාවේදී සේවක නොසන්සුන්තාවයක් ඇති වූ බවත්,

(ඊ) එම සේවක නොසන්සුන්තාවය සමනය කිරීමට කේ. ඩී. අතුල කමල් කලුආරච්චි මැදිහත් වූ බවත් එදින එම රැස්වීමෙන් පසුව වෘත්තීය සමිති ශාඛා සභාපති කේ. ඩී. අතුල කමල් කලුආරච්චි මහතා ආයතනයෙන් බැහැරව යාමෙන් පසුව එදිනම ඔහු කිරිබත්ගොඩ නගරයේ දී කිසියම් මැර ප්‍රහාරයකට ලක්වී ඇති බවට තොරතුරු සේවකයින් වෙත හා ආයතනය වෙත ලැබී ඇති බවත්,

(උ) එම ප්‍රහාරයට දෙවන පාර්ශ්වය වන ආයතනයේ මානව සම්පත් කළමනාකාරිණි අනෝමා ද සිල්වා මහත්මිය සම්බන්ධ බවට සැක කරමින් කේ. ඩී. අතුල කමල් විසින් කිරිබත්ගොඩ පොලීසියට පැමිණිල්ලක් කර ඇති බවට ආරංචි ඇතත් පොලීසිය සාධාරණ පරීක්ෂණයක් පවත්වා නැත.

ඉහත දැක්වෙන පිළිගත් කරුණු අනුව දෙපාර්ශ්වය අතර කම්කරු ආරවුලක් දිගින් දිගටම පැවති බව මාගේ අවධානයට ලක් වී ඇත.

දෙවන පාර්ශ්වය වන ආයතනයට නව මානව සම්පත් කළමනාකාරිණි අනෝමා ද සිල්වා මහත්මිය පැමිණීමෙන් පසුව වෘත්තීය සමිතිය සම්බන්ධයෙන් දැඩි විරෝධ ආකල්පයෙන් කටයුතු කළ බවත්, විශේෂයෙන්ම වෘත්තීය සමිති සාමාජික සේවකයින්ගේ අයිතිවාසිකම්වලට හානි වන ආකාරයට වැඩියෙන් මිනිස් බල සේවකයින් ඇයට සම්බන්ධතාවයක් ඇති ආයතනය යොදා ගැනීමට කටයුතු කළ බවත්, එසේම යන්ත්‍රවල නිෂ්පාදන වේගය වැඩි කිරීමට ගත් උත්සහාය නිසා සේවකයින් අතර මෙන්ම වෘත්තීය සමිතිය අතරද නොසන්සුන්තාවයක් ඇති කිරීමට හේතු වූ බවත් පළවන පාර්ශ්වය විසින් පෙන්වා දෙන ලදී. එම තත්ත්වය යටතේ දෙපාර්ශ්වය ඔවුනොවුන් අතර යම් සැකයකින් කටයුතු කර ඇති අතර 2013.04.10 වෙනි දින බේරුම්කරණයට අදාළ සේවක කේ. ඩී. අතුල කමල් කලුආරච්චි යන අයට කිරිබත්ගොඩ දී නාදුනන පුද්ගලයින් පිරිසක් විසින් සිදු කරන ලද පහරදීමට දෙවන පාර්ශ්වයේ මානව සම්පත් කළමනාකාරිණි අනෝමා ද සිල්වා මහත්මිය සැක කරන බවට අතුල කමල් විසින් පොලිසියට පැමිණිලිකර ඇති බව පැහැදිලිය. එහෙත් පොලිසිය සේවකයින් සම්බන්ධයෙන් ක්‍රියාත්මක නොවීමෙන් සේවකයින්ගේ දුක් ගැනවිලි කීමට නොහැකි බැව් පෙනී යයි.

ඕනෑම පුද්ගලයෙකුට එරෙහිව යම් අපරාධයක් සිදු වූ විට ඒ සඳහා පොලිස් පරීක්ෂණ පවත්වාගෙන යාමට තමන් සැක කරන්නේ කවුරුන්දැයි ප්‍රකාශ කිරීම වරදක් නොවේ. තමන්ට එරෙහිව අපරාධයක් සිදු වී ඇති විට ඒ පිළිබඳව පොලිසියට පැමිණිල්ලක් කිරීමද වරදක් නොවේ.

වෘත්තීය සමිතිය සහ සමාගම අතර පැවති ආරවුල සාධාරණ ලෙස සාකච්ඡා කොට විසඳා ගැනීමට කිසිවෙකු ප්‍රයත්නයක් දරා නැති අතර ඊට බාධාවක් වී ඇත්තේ මානව සම්පත් කළමනාකරණ නිලධාරිනි අනෝමා ද සිල්වා මහත්මිය මේ ප්‍රශ්නය බේරුම් කිරීමට කිසිම උත්සාහයක් නොගැනීමයි.

ඉංග්‍රීසි ජාතික රොබට් නොක්ස් මහතාද සිංහල කවියෙකු විසින් සඳහන් කර ඇති

''දුන්න දුනු ගමුවේ
ඊතල කිතල ගමුවේ
රාළ මී ගමුවේ
මුවෙක් හැඬුවායි සබරගමුවේ''

හැඬූ පුද්ගලයා අතුල කලුආරච්චි බව මගේ සිහියට නැගේ.

පිළිගත් වෘත්තීය සමිති සේවකයකු මෙලෙස දුක්විඳි බැව් ඇන්සල් සමාගමේ මානව සම්පත් නිලධාරිනි අනෝමා ද සිල්වා මහත්මිය නොදැන සිටියැයි පැවසීම අපට තේරුම් ගත නොහැකිය.

මේ සම්බන්ධයෙන් පළමුවන පාර්ශ්වය වෙනුවෙන් සාක්ෂියට කැඳවන ලද සේවක දසන්ත ජයලත් මහතාගේ සාක්ෂියේදී ඔහු ප්‍රකාශ කර සිටියේ අතුල කමල් කලුආරච්චි සේවක අයිතීන් වෙනුවෙන් පෙනී සිටීම මානව සම්පත් කළමනාකාරිණියගේ නොසතුටට හේතු වූ බවයි. එම සාක්ෂියට දෙවන පාර්ශ්වය විසින්

අභියෝග කර නොමැති වුවද අතුල කමල් මහතාට පහර දීම සම්බන්ධයෙන් මානව සම්පත් කළමනාකාරිණිය අතුල කමල් මහතා සමඟ කෝප වී සිට ඇති බවයි. මානව සම්පත් කළමනාකාරිණියට එරෙහිව අතුල කමල් මහතා පැමිණිලි කිරීම සම්බන්ධයෙන් මානව සම්පත් කළමනාකාරිණිය පොලීසිය වෙත පැමිණිල්ලක්ද කර නැත. මේ අනුව පැහැදිලි වන්නේ මානව සම්පත් කළමනාකාරිණිය අතුල කමල් කලුආරච්චි සහ වෙනත් වැඩ වර්ජනයට සම්බන්ධ වූ සේවකයන් සමග අමනාපයෙන් සිට ඇති බවයි.

7. ඉහත සඳහන් කරුණු අනුව මෙම සිද්ධියේ දී දෙවන පාර්ශ්වය විසින් ක්‍රියා කර ඇති ආකාරය සේවක පක්ෂය හෙවත් වෘත්තිය සමිතියට එරෙහිව හා වෘත්තිය සමිති ශාඛා සභාපති ඇතුලු පිරිසට එරෙහිව ක්‍රියා කිරීමට දෙවන පාර්ශවය කටයුතු කර නැති බවත් සාක්ෂි මගින් අනාවරණය වී ඇත. මෙයින් පැහැදිලි වී ඇත්තේ අතුල කමල් කලුආරච්චි මහතාගේ සභාපති ධූරය දරන වෘත්තිය සමිතිය කෙරෙහි සමාගම එනම් ඇන්සල් ලංකා පුද්ගලික සමාගම සේවක වෘත්තීය සමිතියටත් විශේෂයෙන් ශාඛා සභාපතිටත් විරුද්ධව ක්‍රියා කර ඇති බවත්ය.

8. පළවෙනි පාර්ශ්වය වෙනුවෙන් සාක්ෂි දෙමින් අතුල කමල් කලුආරච්චි පවසා සිටියේ තමන්ට කිරිබත්ගොඩදී පහර දීමෙන් පසුව පොලීසියට පැමිණිලි කල බවත් වෘත්තීය සමිතිය විසින් ඒ පිළිබඳව දෙවන පාර්ශ්වය එනම් ඇන්සල් ලංකා පුද්ගලික සමාගමට දැනුම් දුන්න ද ඒ පිළිබඳව ප්‍රකාශයක් තමාගෙන් ඉල්ලා සිටි විට එය පොලීසියේ කාර්යයක් බව සඳහන් කර ඇත.

9. මේ සම්බන්ධයෙන් දෙවන පාර්ශ්වය කියා සිටියේ අතුල කමල් ගෙන් නිදහසට කරුණු විමසීමෙන් පසුව ඔහු ඇතුලු පිරිස පැමිණ සේවකයින්ව ආයතනයට එරෙහිව ක්‍රියා කිරීමට පොළඹවන ලද බවත්, නොයෙක් වැරදි සහගත ක්‍රියාවන් සිදු කරනු ලැබූ බවත් ය.

මෙම කාරණය සැලකිල්ලට ගැනීමේදී අතුල කමල් වෙනුවෙන් සාක්ෂියට කැඳවනු ලැබූ ජයලත් මහතාගේ සාක්ෂියේදී ප්‍රකාශ කල පහත සඳහන් කරුණ මම සැලකිල්ලට ගනිමි. ඒ වන විට ශාඛා සමිති සභාපති අතුල කමල් මහතා දැඩි ලෙස සහ ඉතා කැපවීමෙන් සේවක අයිතීන් වෙනුවෙන් පෙනී සිටීම සම්බන්ධයෙන් මානව සම්පත් කළමනාකාරිණිය නොසතුටකින් සිටි බව සේවකයින් දැන සිටි අතර එම පහරදීම සම්බන්ධයෙන් මානව සම්පත් කළමනාකාරිණියගේ සම්බන්ධතාවයක් ඇති බවට අතුල කමල් මහතා විසින් ද දැනුම් දී ඇති බව මට දැනගන්නට ලැබුනි.

(සේවක ඩබ්ලිව් ඩී. ජී. ජයලත් ගේ දිවුරුම් ප්‍රකාශයේ 17 වන ඡේදය)

මෙම වැඩ වර්ජනය කිරීම අතුල කමල් සම්බන්ධයෙන් ගන්නා ලද ක්‍රියාවට එරෙහි පමණක් නොව නොවිසඳුනු සේවක ප්‍රශ්න කීපයක් ද මුල් කර ගෙන ආරම්භ කරන ලද්දක් බවත් අතුල කමල්ගේ ප්‍රශ්නය විසඳනු ලැබුවේ නම් එම වැඩ වර්ජනය නවත්වන ලෙසට ඉල්ලීමක් කිරීමට තමන්ට හැකියාවක් තිබූ බව අතුල කමල් ප්‍රකාශ කරන ලදී. එම වැඩ වර්ජනය ආරම්භ වීමෙන් පසුව අතුල කමල් බේරුම්කරණයට අදාළ අනිකුත් සේවකයින් 10 දෙනාගේ සේවයද 2 වන පාර්ශ්වය විසින් අවසන් කිරීමට පියවර ගෙන ඇත.

10. මේ අනුව බේරුම්කරණයට අදාළ සේවකයින්ගේ සේවය අවසන් කිරීමට පසුබිම් වූ කාරණා පිළිබඳව බේරුම්කරණය ඉදිරියේ පවතින කරුණු සලකා බැලීමේදී මෙම බේරුම්කරණයට අදාළ සේවකයින් 11 දෙනාගේ සේවය අවසන් කිරීමට දෙවන පාර්ශ්වය විසින් ගෙන ඇති පියවර අසාධාරණ සහ අයුක්ති සහගත පියවරක් බවට මම තීරණය කරමි.

මා එම තීරණයට එළඹීමට හේතු වූ කරුණු වන්නේ :

(අ) දෙවන පාර්ශ්වය විසින් මෙම බේරුම්කරණයට අදාළ සේවකයින්ගේ සේවය අවසන් කිරීම පැහැදිලිවම වෘත්තීය සමිති මර්දනය කිරීමේ සහ පලිගැනිමේ අරමුණින් කරන ලද්දක් බව සාක්ෂි මගින් තහවුරු වීම.

(ආ) 2013.04.10 වෙනි දින දෙවන පාර්ශ්වයේ ආයතනය තුළ පිහිටුවා තිබු පළමුවන පාර්ශ්වයට සම්බන්ධ වෘත්තීය සමිති ශාඛාවේ සභාපතිවරයා විසින් ආයතනයේ කළමනාකාරිත්වය හා වෘත්තීය සමිති සාමාජිකයින් අතර පැවැති ආරවුලෙන් අනතුරුව වෘත්තීය සමිති සාමාජිකයින් අමතා එකී ආරවුල සමථයකට පත් කළ බව සාක්ෂි වලින් කියැවිණි. ඒ අනුව වෘත්තීය සමිති ශාඛා සභාපතිවරයා ආයතනය තුළ සේවකයින් සම්බන්ධයෙන් යම් නායකත්වයක් දරන බව කළමනාකාරිත්වය විසින් අවබෝධ කර ගෙන ඇති අතර අතුල කමල් යන අයට කිරිබත්ගොඩ දී පහරදීම මානව සම්පත් කළමනාකාරිණියගේ මැදිහත් වීම මත සිදු කර ඇති බවට පළවන පාර්ශ්වයේ ස්ථාවරය පිලිගැනීමට තරම් සාක්ෂි ඉදිරිපත්ව තිබීම්.

(ඇ) අතුල කමල්ට කිරිබත්ගොඩදී සිදු වූ පහරදීමට මානව සම්පත් කළමනාකාරිණිය සම්බන්ධ වූ බවට ඔහු විසින් පොලීසියට පැමිණිලි කළ විට එබඳු සිද්ධියක් සම්බන්ධයෙන් මානව සම්පත් කළමනාකාරිණියගේ කරුණු විමසීමකින් තොරව පහර කෑමට යටත් වූ පුද්ගලයාම චූදිතයෙකු බවට පත් කර නිදහසට කරුණු විමසීම.

(ඈ) එම වැරදි ක්‍රියා මාර්ගය නිවැරදි කර ගැනීම සඳහා වෘත්තීය සමිති ශාඛාව විසින් සාකච්ඡා මගින් විසඳුමක් ලබා ගැනීමට ගන්නා ලද උත්සාහය ව්‍යර්ථ කිරීම සඳහා දෙවන පාර්ශ්වය ක්‍රියා කර තිබීම.

(ඉ) ඉන් අනතුරුව වෘත්තීය සමිති ශාඛා සභාපතිවරයාට චෝදනා පත්‍ර ලබා දීම මෙන්ම පසුව වැඩ තහනම් කිරීම වෘත්තීය සමිතියට එරෙහිව ක්‍රියා කිරීමක් ලෙස සලකා සේවකයින් වැඩ වර්ජනය කළ විට එම වැඩ වර්ජනයටද විසඳුම් ලබා නොදෙමින් වෘත්තීය සමිති සාමාජිකයින් 300 කට වැඩි පිරිසකගේ සේවය අවසන් කර තිබීම.

(ඊ) දෙවන පාර්ශ්වය විසින් සේවය අවසන් කර ඇති මෙම බේරුම්කරණයට අදාළ සේවකයින් 11 දෙනාගෙන් අතුල කමල් සහ තවත් සේවකයින් දෙතුන් දෙනකු හැර අන් කිසිදු සේවකයෙකුට එරෙහිව ඔවුන් කිසිදු විෂමාචාරයක්

වරදක් කළ බවට දෙවන පාර්ශ්වය විසින් කිසිදු සාක්ෂියක් ඉදිරිපත් කර නොතිබියදී ඔවුන්ගේ සේවය අවසන් කර තිබීම අනුව වෘත්තීය සමිති සාමාජිකයින් වීම මත පමණක් ඔවුන්ට එරෙහිව ක්‍රියා කර ඇති බවට නිගමනයට එළඹීමට හැකිවීම.

(උ) මෙම සේවකයින්ගේ සේවය අවසන් කිරීමේදී දෙවන පාර්ශ්වය විසින් සාධාරණ සහ යුක්ති සහගතභාවයට පටහැනිව ක්‍රියා කරන ලද බව පැහැදිලිවීම.

(ඌ) බේරුම්කරණයට අදාළ සේවකයින් ස්ථිර සේවකයින් වන අතර අතුල කමල් හැර අනිකුත් සේවකයින්ගේ සේවය අවසන් කිරීමට ප්‍රථම අඩු තරමින් ඔවුන්ගෙන් නිදහසට කරුණු විමසීමක් හෝ දෙවන පාර්ශ්වය සිදු කර නොතිබීම.

(එ) පුද්ගලයෙකු මරණීය දණ්ඩනයට යටත් කරන අවස්ථාවකදී වුවද ඒ සම්බන්ධයෙන් ඔහුට කීමට ඇති දේ කීමට අවස්ථාවක් දෙනු ලැබේ. සේවකයෙකුගේ සේවය අවසන් කිරීම මරණ දඬුවමකට යටත් කිරීමක් හා සමාන වන අතර එම දඬුවම් දීමට ප්‍රථම ඔවුන්ට චෝදනා නගනු ලබන වරද සිදු කළේ ද යන කරුණු හෝ ඔවුන්ගෙන් විමසීමක් කළ බවක් දෙවන පාර්ශ්වය විසින් පෙන්වා දෙනු ලැබුවේ නැත.

(ඒ) දෙවන පාර්ශ්වය ආයෝජන මණ්ඩලය යටතේ පාලනය වන ආයතනයක් වන අතර ආයෝජන මණ්ඩලය විසින් නිකුත් කර ඇති කාර්මික සබඳතා සහ උපදෙස් සංග්‍රහයේ ප්‍රතිපාදන ආයෝජන මණ්ඩලය යටතේ පාලනය වන සේවකයින් සම්බන්ධයෙන් විනය පියවර ගැනීමේදී අදාළ වන බවත් තම ආයතනයද ආයෝජන මණ්ඩලය යටතේ පාලනය වන ආයතනයක් වන බවත් සාක්ෂිකාර අනෝමා ද සිල්වා විසින් පිළිගන්නා ලදී.

ප්‍ර : එහි 13 වන පරිච්ඡේදයට අනුව සේවකයෙකු සම්බන්ධව විනය පියවර ගැනීමේදී අනුගමනය කළ යුතු ක්‍රියා පිළිවෙත තිබෙනවාද ?

උ : එසේය

ප්‍ර : ඒ ක්‍රියා පිළිවෙත අනුව ආයෝජන මණ්ඩලය යටතේ පාලනය වන ආයතනයක සේවකයෙකුට චෝදනා පත්‍ර නිකුත් කිරීමෙන් පසුව නිවැරදිකරු කියන්නේ නම් ඔහුට විරුද්ධව විනය පරීක්ෂණයක් පැවැත්විය යුතු නේද?

උ : එසේය.

11 (අනෝමා ද සිල්වාගේ සාක්ෂිය)

කෙසේ වුවද මේ බේරුම්කරණයට අදාළ කිසිදු සේවකයෙක් සම්බන්ධයෙන් විධිමත් විනය පරීක්ෂණයක් නොපැවැත්වූ බව අනෝමා ද සිල්වා පිළිගත් අතර ඇයගේ ස්ථාවරය වූයේ මෙම සේවකයින් ක්‍රියා කළ ආකාරය අනුව එලෙස විනය පරීක්ෂණයක් පැවැත්වීමට හැකියාවක් නොතිබුණ බවය. ඇයගේ මෙම ස්ථාවරය බේරුම්කරණයට පිළිගත නොහැකි අතර සාධාරණව සහ යුක්ති සහගතව ක්‍රියා කළ බවට ප්‍රකාශ කළ හැක්කේ තමන් නියමිත ක්‍රම වේදය අනුගමනය කර තිබේ නම් පමණක් වේ.

මෙම සේවකයින්ගේ හැසිරීම හෝ ක්‍රියා කලාපය ඔවුන් සම්බන්ධයෙන් විධිමත් විනය පියවර ගැනීම ඔවුන් විසින්ම අහුරන ලද බවට කරන ප්‍රකාශය කිසිසේත්ම පිළිගත නොහැකි අතර ඔවුන් සම්බන්ධයෙන් විනය පියවර ගැනීමට පෙර ඔවුන්ගෙන් නිදහසට කරුණු විමසීම තැපැල් මගින් කළ හැකිව තිබින. ඒ සඳහා ලිඛිතව පිළිතුරු දීමටත් එසේම පරීක්ෂණයක් ආයතන පරිශ්‍රයෙන් බැහැර ස්ථානයක පැවැත්වීමටත් තිබුන බාධාව කුමක් දැයි දෙවන පාර්ශ්වය පැහැදිලි කර නැත.

ඒ අනුව මෙම සේවකයින්ගේ සේවය අවසන් කිරීමට ප්‍රථම සේවය අවසන් කිරීමට අදාළ වූ කරුණු සම්බන්ධයෙන් ඔවුන්ගේ වරදකාරීත්වයක් තිබේද නැද්ද යන්න තහවුරු කර ගැනීම සඳහා නිසි පරීක්ෂණයක් කළ හැකිව තිබියදී එසේ නොකරමින් මෙම සේවකයින්ගේ සේවය කිසිදු වග විභාගයකින් තොරව අවසන් කිරීම මගින් දෙවන පාර්ශ්වය ඔවුන් සම්බන්ධයෙන් අසාධාරණව අයුක්ති සහගතව ක්‍රියා කර ඇති බවට තීරණය කරමි.

බේරුම්කරණයට අදාළ සේවකයින්ගේ සේවය අවසන් කිරීමට දෙවන පාර්ශ්වය ක්‍රියා කර තිබුනද ඔවුන්ගේ සේවය අවසන් කිරීමට හේතු වූ කරුණු වලට ඔවුන්ගේ සම්බන්ධතාවයක් තිබේ දැයි නිශ්චිතව හඳුනා ගැනීමක් නොකරමින් සේවය අවසන් කර ඇති බවට බේරුම්කරණය විසින් නිගමනයට එළඹ ඇත.

දෙවන පාර්ශ්වය විසින් සේවය අවසන් කළා යැයි සඳහන් සේවකයින් 11 දෙනෙකුගේ නම් බේරුම්කරණයට යොමු කර ඇති නමුදු එම 11 දෙනාම කිසියම් වරදකට සම්බන්ධ වූ බවට නිශ්චිතව කිසිදු සාක්ෂියක් හෝ අදාළ සේවකයින් 11 දෙනාගේම සේවය අවසන් කිරීමට අදාළ වන වැරදි සිදුකළ බවට 2 වන පාර්ශ්වය සාක්ෂි ඉදිරිපත් නොකළ අතර 2 වන පාර්ශ්වයේ සාක්ෂිකාර ඉන්ද්‍රජිත් සමරනායක සිය සාක්ෂියේ දී කියා සිටියේ ඔහු කියන්නේ අසා දැනගත් සාක්ෂි වන බවත් තමා චෝදනා සකස් කිරීමට සම්බන්ධ නොවූ බවත් ය.

සිද්ධිය සම්බන්ධ යැයි සේවකයින් 5 දෙනෙක් ගැන තමන් මානව සම්පත් අංශයට දැනුම් දී ඇති බව ප්‍රකාශ කළ නමුදු එබඳු ලේඛනයක් 2 වන පාර්ශ්වයෙන් බේරුම්කරණයට ඉදිරිපත් වූයේ නැත. ඔහුගේ එම ප්‍රකාශයට අනුව 5 දෙනෙක් යම් සිද්ධීන් වලට සම්බන්ධ වූ බවට ප්‍රකාශ කරන්නේ නම් 6 දෙනෙකු එම කරුණු වලට සම්බන්ධ වී නැත. ඒ අනුව සඳහන් කරන සිද්ධීන්ට සම්බන්ධ වූවන් කවුරුන්දැයි 2 වන පාර්ශ්වය පැහැදිලි නොකරන බවට දී වැරදි නොකළ පුද්ගලයින් කිසිසේත් ම දඬුවමකට යටත් කළ නොහැකි වන අතර එහි ප්‍රතිඵලය විය යුත්තේ සියලු දෙනාම නිදහස් වීම බව බේරුම්කරණයේ නිගමනය වේ.

විශේෂයෙන්ම මෙම සේවකයින් සම්බන්ධයෙන් මූලික විමර්ශනයක් පැවැත් වූ බවට කිසිදු සාක්ෂියක් ඉදිරිපත් නොවූ අතර 2 වන පාර්ශ්වයේ සාක්ෂිකාර අනෝමා ද සිල්වා කියා සිටියේ මූලික විමර්ෂණයේ දී ලබා ගත් සාක්ෂි හෙවත් ප්‍රකාශ බේරුම්කරණයට ඉදිරිපත් කළේ දැයි තමන්ට මතක නැති බවය.

ප්‍ර : 13 : 1 වගන්තිය ප්‍රකාරව තමුන් කටයුතු කළේ නැහැ නේද?

උ : අප පළමුවෙන් ම අස් කරන්න සිදු වූණේ අතුල කමල් කියන සේවකයා වේ. එතනදී ඔහුට කරුණු විමසා ලිපිය දීමට පෙර ඒ සම්බන්ධව පරීක්ෂණ පවත්වා ලිඛිත ප්‍රකාශ ආයතනය විසින් ලබාගෙන තිබෙනවා. ඊට අනුව කරුණු විමසීම් ලිපිය ලැබුණා. එයට අමතරව අනෙක් අය සම්බන්ධව මූලික පරීක්ෂණයක් සිදුකළේ නැහැ.

ප්‍ර : මූලික විමර්ෂණයේ දී ලබාගෙන ඇති ප්‍රකාශ ඉදිරිපත් කළා ද?

උ : සාක්ෂි තිබෙනවා. නමුත් ගොනු කළා ද මතක නැහැ.

ප්‍ර : මේ මොහොත වනතෙක් කිසියම් සාක්ෂිකරුවෙකුගේ ලබා ගන්නා ලද සාක්ෂි ඉදිරිපත් කර තිබෙනවාද ?

උ : මට මතක නැහැ.

(අනෝමා ද සිල්වාගේ සාක්ෂිය)

වරදකරුවන් 10 කට දඬුවම් කිරීමකට වඩා වැදගත් වන්නේ එක් නිදොස් පුද්ගලයෙකු නිදහස් කිරීම වේ.

මෙම බේරුම්කරණයට අදාළ සේවකයින්ගේ සේවය අවසන් කිරීම 2 වන පාර්ශ්වය විසින් ආයතනය තුළ ක්‍රියාත්මක වූ වෘත්තීය සමිතිය මර්ධනය කිරීම සහ වෘත්තීය සමිති කටයුතු වල නිරත වීමට එරෙහිව ක්‍රියා කිරීමක් වන බව වඩාත් පැහැදිලි වන්නේ වෘත්තීය සමිතියේ ශාඛා සභාපති අතුල කමල්ගේ සේවය අවසන් කිරීමේ දී ක්‍රියාකර ඇති ආකාරය අනුව වේ. අතුල කමල් යන අයට ආර්-7 මගින් චෝදනා කිරීමේ දී ප්‍රධාන චෝදනා වන්නේ අතුල කමල් යන අයට කිරිබත්ගොඩ දී කරන ලද පහර දීම සම්බන්ධයෙන් ආයතනයේ මානව සම්පත් කළමණාකාරිණී අනෝමා ද සිල්වා සැක කරන බවට පොලීසියට පැමිණිලි කිරීම හා සේවකයින් දැනුවත් කිරීම සම්බන්ධ කර ගනිමිනි.

වෘත්තීය සමිති ශාඛා සභාපතිට එලෙස චෝදනා කර ඔහුට නිදහසට කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලබා නොදී ඔහුගේ සහ බේරුම්කරණයට අදාළ අනිකුත් සේවකයින්ගේ සේවය අවසන් කර ඇත. අනෙකුත් සේවකයින්ගෙන් නිදහසට කරුණු විමසීමක් හෝ කර නොමැති අතර අතුල කමල්ට නිදහසට කරුණු ඉදිරිපත් කිරීමට නියම කිරීම මගින් එකම සිද්ධියේ දී දෙයාකාරයකට මෙන්ම දෙබිඩි පිළිවෙතකින් ක්‍රියා කර ඇත. එක් සේවකයෙකුට නිදහසට කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදීමත්, එකම සිද්ධියේ අනෙකුත් සේවකයින්ට එබඳු අවස්ථාවක් ලබා නොදීමත් යන කරුණු සමාන කරුණු යෙදී ඇති අවස්ථාවක දී සමාන තත්වයේ සිටින අයට දෙයාකාරයෙන් සැලකීමක් වේ. එය අය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සහතික කර ඇති 12(1) සහ (2) ව්‍යවස්ථාව මගින් සහතික කර ඇති මූලික අයිතිවාසිකම් කඩ කිරීමක් වේ.

මූලික අයිතිවාසිකම් සහතික කිරීම පෞද්ගලික අංශයේ වගකීමක් නොවුන ද එය විශ්ව සම්මත මුල ධර්මයක් වේ. ඒ අනුව එම මූලධර්මයට පටහැනිව දෙවන පාර්ශවය මෙම සේවකයින්ගේ සේවය අහිමි කිරීමේදී ක්‍රියා කර ඇති බව පැහැදිලිය.

එසේම අතුල කමල්ගේ සේවය අවසන් කිරීමේ සිද්ධියේ දී ඔහුට ආර්-7 චෝදනා පත්‍රය නිකුත් කර ඇත්තේ 2013.10.15 දතමිනි. චෝදනාවන්ට පිළිතුරු ලබා දීම සඳහා එම ලිපියෙහි සඳහන් දිනයෙහිම ලිපිය ලැබුණු බව සලකනු ලැබුව ද 2013.10.19 දින දක්වා සේවකයාට අයිතියක් තිබුනි. එසේ වුව ද සේවකයාට පිළිතුරු ලබාදීමට අයිතිය තිබූ කාලය ඉක්ම යාමට ප්‍රථම 2013.10.15 දින දරන එහෙත් ආර්-8 දරන ලිපිය මගින් අතුල කමල් ඇතුළු සේවකයින්ගේ සේවය 2 වන පාර්ශවය විසින් අවසන් කර ඇත. එය අතුල කමල්ට නිදහසට කරුණු ඉදිරිපත් කිරීම සඳහා දී තිබූ කාලය අවසන් වීමටත් පෙර ගත් තීරණයක් වේ.

මෙම බේරුම්කරණ නඩුව අවසන් කිරීමට පෙර සමාගමේ ඉතා පළපුරුදු සාක්ෂිකාරියක වන ඇන්සල් (ලංකා) සමාගමේ අවුරුදු 20ක් පමණ කාලයක් සේවය කළ අනෝමා ද සිල්වා මහත්මිය බේරුම්කරණයෙන් අවසර ලබා නොගෙන ලංකාවෙන් බැහැර රටකට ගොස් සති දෙක තුනක කාලයක් ඇමරිකාවේ හෝ එංගලන්තයේ කාලය ගත කොට පසුව ලංකාවට ආපසු පැමිණ නැවත බේරුම්කරණයට සහභාගී විය. පිළිගත් සම්ප්‍රදාය අනුව සාක්ෂිකරු රටින් බැහැරව යන බව සහ ඇය එම රටවල සේවය ගැන කිසිවක් බේරුම්කරණයට දන්වා නොමැත. අපට දැනගන්නට ලැබුණු කරුණු අනුව මෙම නඩුව අතපසු කොට පිටරට යාමේ සිද්ධිය සමාගමේ කාර්යයක් සම්බන්ධයෙන් බව නීතිඥයින් අතර සාකච්ඡා ඇති විය.

අවුරුදු 25කට වඩා කාලයක් බේරුම්කරණ විනිශ්චය සභාවේ සේවය කර ඇතිමුත් මගේ අවසර ලබා නොගෙන සාක්ෂිකාරුවෙකු පිට රටකට ගොස් ඒ එම අවශ්‍යතාවය අවසන් කිරීමෙන් පසු නැවත සාක්ෂිදීමට ඒ ගැන කිසිම කරුණක් පැහැදිලි කර නැත. මෙලෙස තමන්ට අවශ්‍ය පරිදි රටින් බැහැර ගොස් නැවත සාක්ෂි දීම පිළිගත් සම්ප්‍රදය නොවේ.

ඇන්සල් (ලංකා) සමාගමේ සේවකයින් සහ පාලන නිලධාරීන් අතර සම්බන්ධතාවයක් හටගෙන තිබුණු බැව් සාක්ෂි වලින් පැහැදිලිය. එසේ වුවත් වැදගත් අවස්ථා වලදී සේවකයින්ගේ අවශ්‍යතාවය සහ හැසිරීම හේතුකොට ගෙන සේවකයින්ගේ සුභ සිද්ධිය සලකා දෙපාර්ශවය සාකච්ඡා කොට සමථයක් ඇතිකර ගැනීමට කටයුතු කිරීමට 4(1) වගන්තිය අනුව පැහැදිලි වේ.

ලංකාවේ පෘතුගීසි සමයේ පැවැති පාලන සමයේ ඇති වූ සිද්ධීන් එකක් හෝ දෙකක් ගැන යමක් අපට ඉගෙන ගැනීමට පුළුවන.

උඩරට කුමරුවක වන කොනප්පු බණ්ඩාර කොළඹ කොටුවේ පාලන කළ දෝන කතිරිනා පෘතුගීසි කුමරියගේ කැමැත්ත ඇතිව බොහෝ අවස්ථාවලදී කොනප්පු බණ්ඩාර කුමරුගේ අවශ්‍යතාවය පරිදි අවස්ථාවල දී දෝන කතිරිනා කුමරිය කොනප්පු බණ්ඩාරගේ කැමැත්ත සහ සැලකීමට ඉඩ දෙන ලද බැව් ඇතැම් ඓතිහාසික ලියවිලි වල දක්නට ඇත. ඇන්සල් (ලංකා) සමාගමේ පාලන අධිකාරිය සමග කිට්ටු සබඳතාවයක් ඇති වැඩ වර්ජනයට සහභාගී වීමට හේතුකොට ගෙන රැකියා අහිමි කළ මෙම බේරුම්කරණයේ සඳහන් සේවකයින් 11 දෙනාට යම් සහනයක් හෝ සමථයක් හෝ

ලබා දීමට ඒ ගැන උනන්දුවක් සිතට ගෙන මෙම සේවකයින් 11 දෙනාට යම් සහනයක් ලබාදීමට අනෝමා ද සිල්වා මහත්මියට හැකියාවක් තිබුණු බව මගේ විශ්වාසයයි.

මෙම බේරුම්කරණයේ අවුරුදු 25කට වඩා සේවය කර ඇති මා දෙපාර්ශ්වය සමඟ සාකච්ඡා කොට සමථ ඇති කිරීමට මා සමත් වීම කගේත් සතුටට හේතුවුණු බැව් මම සිතමි.

කාර්මික ආරවුල් පනතේ (131 වැනි පරිච්ඡේදය) එම පනතේ 3(1), 4(1), 15ඒ සහ 16 දරන වගන්ති කෙරෙහි දෙපාර්ශවයේම අවධානය මම යොමු කරමි. එම වගන්ති විනාඩි 10ක් ඇතුළත කියවා ඔබ සැමට තේරුම් ගත හැකිය. ඉහත සඳහන් වගන්ති කිහිපය මත මෙම ආරවුල සාධාරණ ලෙස සමථයකට පත් කළ හැකිය.

වැඩ වර්ජනය හේතු කොට ගෙන වෘත්තීය සමිතියේ රෙගුලාසි අනුව ඉහත සඳහන් සේවකයින් එකොලොස් (11) දෙනාට හිමි දීමනා සහ බෝනස් දීමනා ඔවුන්ට ගෙවා නැතිනම් එම දීමනා නිවැරදි ලෙස ගණනය කර ඔවුන්ට ගෙවන ලෙස අන්සල් (ලංකා) ප්‍රයිවට් ලිමිටඩ් සමාගමට මම නියෝග කරමි.

මෙම ප්‍රදානය රජයේ ගැසට් පත්‍රයේ පළකොට මාස දෙකක් ඇතුළත මෙම ගෙවීම් කළ යුතු බවද දන්වා සිටිමි.

නීතිඥ ටී. පියසෝම,
බේරුම්කරු.

2018 නොවැම්බර් මස 29 වැනි දින,
නාරාහේන්පිට කම්කරු මහලේකම් කාර්යලයේ දී ය.

02 - 276

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.